IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2016/2017

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2018 දෙසැම්බර්)

## BLE 201 - සාර්ව ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(2) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(3) කාලය පැය තුනයි (03).

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

**01.**

I. “සාර්ව ආර්ථික විද්‍යාවේ ඓතිහාසික විකාශණය එම විෂය ප්‍රථම වරට හදාරන්නෙකුට වැදගත් වේ.” සම්භාව්‍ය ආර්ථික විද්‍යාව (Classical Macroeconomic) හා කේන්සියානු ආර්ථික විද්‍යාව (Keynesian Macroeconomics) අතර සමාන අසමානතාවයන් දක්වන්න.

**(ලකුණු 08)**

II. රටක සාර්ව ආර්ථික අරමුණු පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

**(ලකුණු 08)**

III. සාර්ව ආර්ථික සමතුලිතය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 20)**

**02.**

I. ආර්ථික ගණුදෙනු හේතුකොටගෙන ඇතිවන්නා වූ මූර්ත සහ මූල්‍ය ප්‍රවාහයන් මොනවාද?

**(ලකුණු 05)**

II. “ආර්ථික ක්‍රියාකාරීත්වය තුළින් හටගන්නා වූ චක්‍රීය ප්‍රවාහයේ ඇතැම් දේවල් ගිලිහෙන අතර තවත් දේවල් ප්‍රවාහයට එකතුවේ.”

a) ඔබ මෙහිදී ගිලිහීම් (Withdrawals) සහ විදීම් (Injections) ලෙස අදහස් කරන්නේ කුමක්ද?

**(ලකුණු 03)**

b) අංශ තුනකින් යුතු ආර්ථිකයක ගිලිහීම් හා විදීම් හඳුනාගන්න.

**(ලකුණු 03)**

c) ගිලිහීම් හා විදීම් ආධාරයෙන් හිඟ අයවැයක් (Deficit budget) යන්න පැහැදිලි කොට ඉන් චක්‍රීය ප්‍රවාහයට වන බලපෑම හඳුනාගන්න.

**(ලකුණු 04)**

III. දළ දේශීය නිෂ්පාදිතය (GDP) හා සම්බන්ධ සංකල්ප භාවිතයෙන් ඇතිවන වාසි සහ අවාසි මොනවාද?

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 20)**

**03.**

**I.** ආන්තික පාරිභෝජන නැම්යාව (MPC = Marginal Propensity to Consume) ඔබ පැහැදිලි කරන්නේ කෙසේද?

**(ලකුණු 04)**

**II.** අංශ 02 කින් යුත් කල්පිත ආර්ථිකයක කුටුම්භයෙන් යම් කාලච්ඡේදයක් තුළ සාමාන්‍යයෙන් රු. 200 ක අනිවාර්ය පාරිභෝජනයක් සිදුකරනු ලබන අතර වැඩිවන ආදායමෙන් 75% ක ප්‍රමානයක් පරිභෝජනයට වැය කරයි. ව්‍යාපාරික අංශය එම කාලච්ඡේදය තුළදී රු. 200 ක ආයෝජනයක් සිදුකර ඇත. (මෙම සංඛ්‍යා සියල්ල රු. මිලියන වලිනි)

a) පාරිභෝජන ශ්‍රිතය ගොඩනගන්න.

**(ලකුණු 02)**

b) ඉතුරුම් ශ්‍රිතය ගොඩනගන්න.

**(ලකුණු 02)**

c) සමහාර (Aggregate) ඉල්ලුම් ශ්‍රිතය ආධාරයෙන් සමතුලිතයේදී ජාතික ආදායම ගණනය කරන්න.

**(ලකුණු 04)**

d) ගිලිහීම් සහ විදීම් ආධාරයෙන් සමතුලිතයේදී ජාතික ආදායම් ගණනය කරන්න.

**(ලකුණු 04)**

e) සමතුලිතයේදී ඉතුරුම් හා පරිභෝජනය කොපමණද?

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 20)**

**04.**

**I.** ගුණක ක්‍රියාවලිය යනු කුමක්ද යන්න අංශ දෙකකින් යුත් ආර්ථිකයක් සැලකිල්ලටගෙන පැහැදිලි කරන්න.

**(ලකුණු 04)**

**II.** අංශ දෙකකින් යුත් සරල ආර්ථිකයක ගුණකය, අංශ තුනකින් යුත් ආදායම් බදු සහිත ගුණනයෙන් වෙනස් වන්නේ කෙසේද?

**(ලකුණු 03)**

III. "කිසියම් රටක අපනයන (X) එම ආර්ථිකයේ අභ්‍යන්තර සාධක මත මෙන්ම බාහිර සාධක මතද තීරණය වේ". අපනයන ඉල්ලුම තීරණය කරන අභ්‍යන්තර හා බාහිර සාධක තුන (03) බැගින් තෝරාගෙන ඒවා කෙටියෙන් විස්තර කරන්න.

**(ලකුණු 13)**

**(මුළු ලකුණු 20)**

**05.** කිසියම් කල්පිත ආර්ථිකයකට අදාලව පහත තොරතුරු ඇස්තමේන්තු කර ඇත.

| | | | |
|---|---|---|---|
| පාරිභෝජන ශ්‍රිතය | C | = | 50 + 0.8yd (yd = වැය කල හැකි ආදායම) |
| බදු ශ්‍රිතය | T | = | 50 + ty |
| ආන්තික බදු නැමියාව | t | = | 0.25 |
| රාජ්‍ය වියදම | G | = | 50 |
| ආයෝජනය | I | = | 100 |
| අපනයන | X | = | 10 |
| ආනයන | M | = | 5 + 0.1 y |

I. සමහාර ඉල්ලුම් ශ්‍රිතය ගොඩනගන්න.

**(ලකුණු 05)**

II. සමතුලිතයේදී ජාතික ආදායම කොපමණද?

**(ලකුණු 04)**

III. සමතුලිතයේදී පාරිභෝජනය කොපමණද?

**(ලකුණු 03)**

IV.

a. සමතුලිතයේදී බදු ආදායම කොපමණද?

**(ලකුණු 02)**

b. සමතුලිතයේදී අයවැය හිඟය/ අතිරික්තය කොපමණද?

**(ලකුණු 02)**

V.

a. සමතුලිතයේදී ආනයන වියදම කොපමණද?

**(ලකුණු 02)**

b. සමතුලිතයේදී වෙළඳ හිගය/ අතිරික්තය කොපමණද?

**(ලකුණු 02)**

**(මුළු ලකුණු 20)**

06.

I. චිකාගෝ ප්‍රවේශයට (Chicago approach) අනුව මුදල් නිර්වචනය කරන්නේ කෙසේද? එසේ නිර්වචනය කිරීමට බලපෑ විශේෂිත කරුණු මොනවාද?

**(ලකුණු 06)**

II. මුදලක තිබියයුතු ලක්ෂණ (Characteristics) හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 08)**

III. "මුදල් නිර්වචනය කිරීමේදී ඉන් ඉටුකරනු ලබන කාර්යයන් නොසලකා හැරිය නොහැකිය". මුදලේ කාර්යයන් දෙකක් යෝග්‍ය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

**(ලකුණු 06)**

**(මුළු ලකුණු 20)**

07.

I. මුදල් ප්‍රමාන න්‍යායේ ආදායම් අනුවාදය (Income version of Quantity Theory) කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 04)**

II. කේන්සියානු (Keynesian) න්‍යායේ මුදල් සහ පොලිය පිළිබඳ විග්‍රහයට අනුව මුදල් සඳහා ඇති ඉල්ලුම කුමන චේතනාවන් (Motives) පදනම් කරගෙන ඇතිවන්නේද? පොලී අනුපාතය සහ එම චේතනාවන් සඳහා ඇති මුදල් ඉල්ලුම අතර ඇති සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 11)**

III. IS-LM ආකෘතිය සමතුලිත ජාතික නිමවුම විශ්ලේෂණය කිරීමේදී කේන්සියානු (Keynesian) ආදායම් නිර්ණය ආකෘතියට වඩා උසස් යයි සලකන්නේ මන්ද?

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 20)**

****************************************